**බිංගිරිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු රු. 8,745,085 ක ස්ථාවර වත්කම් අයිතම 42 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුමට ගැලපීම සිදු කරමි. |
| (ආ) | සභාව සතු ඉඩම් 20 ක හා පෙර පාසල්, පුස්තකාල, ළමා උද්‍යාන, සතිපොළ සහ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සතු ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී සිදුකරන ඉඩම් සමීක්ෂණයේදී මෙම දේපල වල වර්තමාන වටිනාකම් සභාවේ ආදායම් පරීක්ෂක මඟින් තක්සේරු කර ඒ අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩරය හා මාර්ග තලනය කුලියට ලබා දීමෙන් අයවිය යුතු කුලී රු.214,075 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟ ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | මාර්ග සංවර්ධන අධිකාරිය කුලියට ගනු ලැබූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා බැකෝ ලෝඩරය සඳහා වන කුලිය නියමිත පරිදි ගෙවා නොතිබූ අතර පසුව එම මුදල් මෙම සභාවට අය කර ගෙන ඇත. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට සභාව සතු රු. 345,198 ක් වූ ආයුර්වේද ඖෂධ තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට පවතින සියළු තොග ශේෂ ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුමට අදාල ජර්නල් සටහන මඟින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉඩම් හා මෝටර් රථ වටිනාකම පිළිවෙලින් රු. 792,000 ක් හා රු.5,112,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙය මුද්‍රණ දෝෂයක් වන අතර ඒ නිසා හටගත් අඩුපාඩු හා වත්කම් වල අගයන්හි වෙනස් වීම් අදාල ජර්නල් සටහන මඟින් 2019 වර්ෂයේ අවසන් ගිණුමට ගැළපීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ලේඛනය අනුව සේවක ණයශේෂය රු. 9,030,884 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 9,301,823 ක් ලෙස දක්වා තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙය පෙර වර්ෂවල සිට පවතින වෙනසක් බව පෙනී යන බැවින් ඒ පිළිබඳ තවදුරටත් තොරතුරු සොයා නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල ශේෂයන් අතර රු.57,231,389 ක නොසැසඳීම් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ උපලේඛන වසර ගණනාවක සිටම නිවැරදිව සටහන් කර නොතිබීම හේතුවෙන් ගිණුමේ ශේෂයට අදාළ නිවැරදි උපලේඛන සකස් කිරීම ගැටලුකාරී වී ඇත. අදාළ උපලේඛන පරීක්ෂාකර බලා අදාළ යාවත්කාලීන කිරීම් සිදු කර මෙම වෙනස අවම කර ගැනීමට කටයුතු කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයන් 03 ක ශේෂයන් හා අදාළ ලේඛන අතර රු. 31,673,360 ක නොසැසඳීම් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ උපලේඛන වසර ගණනාවක සිටම නිවැරදිව සටහන් කර නොතිබීම හේතුවෙන් ගිණුමේ ශේෂයට අදාළ නිවැරදි උපලේඛන සකස් කිරීම ගැටලුකාරී වී ඇත. අදාළ උපලේඛන පරීක්ෂාකර බලා අදාළ යාවත්කාලීන කිරීම් සිදු කර මෙම වෙනස අවම කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (එ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,360,283 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,541,473 ක බැර ශේෂයක් බවට පත් වී තිබුණි. | ඒ පිළිබඳව සොයාබලා අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. | අවිනිශ්චිත ගිණුම වසර ගණනාවක සිටම පැවත එන අතර වර්ෂයෙන් වර්ෂයට යම් යම් අගයන් එකතු කිරීම මත ශේෂය වෙනස් වී ඇත. එය නිවැරදි කිරීමට අදාළව පැරණි තොරතුරු නිවැරදිව සොයා ගැනීම අසීරු වුවත් මෑත කාලසීමා තුළ එකතු වූ අගයන් නිවැරදි කර අවිනිශ්චිත ගිණුමේ ශේෂය අවම කර ගැනීමට කටයුතු කර ඇත.එහෙත් මෑතක් වන තුරුත් ගිණුම්ගත නොවූ බැංකු ගිණුම් දෙකකට අදාළ රු.1,001,767 ක මුදල ගිණුම් ගත කිරීම මත අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.2,541,473 ක් දක්වා වර්ධනය වී ඇත. |
| (ඒ) | එකතුව රු.227,756,730 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් සඳහා අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | සිදුවී ඇති අඩුපාඩුව පිළිබඳව කණගාටු වන අතර ඉදිරි විගණන කටයුතු සඳහා අදාළ ලිපි ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |
| (ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 29,137,196 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 13,457,616 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු. 53,717 ක් වූ අගරු චෙක්පත් පිළිබඳව මුදල් රෙගුලාසි 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 486 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ආ) | මුදල් පොත හා බැංකු ප්‍රකාශනය අතර හඳුනා නොගත් රු. 181,846 ක් වූ වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. | හඳුනානොගත් වෙනස පෙර වර්ෂ වල සිටම පැවත එන අතර ඊට අදාළ තොරතුරු සොයා ගැනීමේ අපහසුවක් ඇත. මේ නිසා මෙම වෙනස නිරවුල් කිරීමට නොහැකි වී ඇත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම රු. | 2018 වර්ෂය බිල්කළ ආදායම රු. | 2018 වර්ෂය රැස්කළ ආදායම රු. | 2018 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2017 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම රු. | 2017 වර්ෂය බිල්කළ ආදායම රු. | 2017 වර්ෂය රැස්කළ ආදායම රු. | 2017 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| I. වරිපනම් හා බදු | 2,879,307 | 3,621,293 | 3,752,289 | 78,938 | 3,319,164 | 4,298,814 | 4,156,815 | 209,953 |
| II. බදු කුලී | 14,702,060 | 13,618,791 | 13,819,122 | 768,007 | 13,928,798 | 14,662,448 | 14,576,193 | 968,338 |
| III. බලපත්‍ර ගාස්තු | 910,000 | 814,005 | 815,005 | - | 380,000 | 790,538 | 789,538 | 1,000 |
| IV. වෙනත් ආදායම් | 70,616,700 | 89,695,292 | 76,819,273 | 44,712,708 | 74,163,500 | 72,047,353 | 72,047,358 | 31,836,689 |
| එකතුව | 89,108,067 | 107,749,381 | 95,205,689 | 45,559,653 | 91,791,462 | 91,799,153 | 91,569,904 | 33,015,980 |

සටහන

2017 හා 2018 රැස්කළ ආදායම් අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟ ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාබල ප්‍රදේශයේ දේපල 90 කින් රු. 24,600 ක අක්කර බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ අය කර ගැනීමට හා අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | විවිධ හේතුන්මත ඉඩම් හිමියන් 43 ක් සඳහා රු 11,780 ක මුදලක් වැඩිපුර ගණනය කර හිඟ බදු මුදල් ලෙස ලේඛනගත වී ඇත. මෙසේ වැඩිපුර ගණනය කර ඇති හිඟ මුදල කපා හැරීමට මහ සභාවේ අනුමැතියක් ලබා ගෙන ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 15 කින් රු. 30,600 ක ව්‍යාපාර බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපාර බදු අය කර ගැනීම සඳහා නඩු පවරා ඇත. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී බිංගිරිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 18 ක් හා හල්මිල්ල වැව, හබවැව කඩ කාමර 02 ක කඩ කුලී තක්සේරු කර තිබුණද, 2018 වර්ෂයේදී එම තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමෙන් රු. 320,160 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | තක්සේරුව ප්‍රකාරව නියමිත ආසන්න වර්ෂයේ සිට කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩකාමර සඳහා වන නව තක්සේරුව 2017.08.02 හා 2017.10.12 වන දින තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත. එවකට ලේකම් මහතාට කඩකුලී වැඩි කිරීම පිළිබඳ වෙළඳ ප්‍රජාවගෙන් විරෝධතාවයක් එල්ල වීම හේතුවෙන් මෙය ක්‍රියාත්මක කර නැත. ලේකම්වරයා විසින් එම තක්සේරුව 2018.10.09 දින මහා සභාවට යොමු කළ අතර මහා සභාව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2019 ජනවාරි 01 දින සිට මෙම තක්සේරුව ක්‍රියාත්මක කර ගාස්තු අයකිරීම ආරම්භ කර ඇත. |
| (ආ) | දේපල බදු දීම්වලට අදාළව සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන අවස්ථා 05 කදී අයවිය යුතු රු. 764,557 ක හිඟ බදු කුලී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | බදු දේපල 04 කට අදාළව නඩු පවරා ඇත. අනෙක් දේපලට අදාළ පුද්ගලයා මිය ගොස් ඇති බැවින් හිඟ මුදල කපාහැරීමට පළාත් පාලන කොමසාරිස් තුමාට යොමු කිරීමෙන් පසුව විමර්ශන කටයුතු සිදුකෙරෙමින් පවතී |

### 2.3.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපාර ඒකක 61 කින් රු. 61,000 වෙළඳ බලපත්‍ර ගාස්තු අයවිය යුතුව පැවතුණු අතර, ඉන් ව්‍යාපාර ඒකක 32 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් නඩු පවරා තිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ හා රීතිවල විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතු වේ. | 2018.12.31 දිනට පෙර M.O.H නිර්දේශ ලැබී ඇති එහෙත් බලපත්‍ර ලබාගෙන නොමැති ව්‍යාපාරිකයන්ගෙන් ක්ෂේත්‍රයට ගොස් එම ගාස්තු අයකර ගෙන ඇති අතර එසේ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාරිකයන් සඳහා නඩු පවරා ඇත. මේ වන විට නඩු 24 ක් සඳහා තීන්දු ලැබී ඇති අතර ඊට අදාල දඩ මුදල් අය කර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිර්දේශ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යවන ලද ව්‍යාපාර ඒකක 136 කට අදාළ අයදුම්පත් අනුමත කර එවා නොමැති වූ අතර ඊට අදාළ බලපත්‍ර ගාස්තු 2018 වර්ෂය තුළ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නියමිත ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ අයදුම්පත් නිසි දිනට යවා ඇතත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් එම ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කර බලා නිර්දේශ මේ වන විටත් ලබා දී නොමැත. මෙම ප්‍රමාදය අවම කර ගැනීම සඳහා 2019 වර්ෂයේදී කටයුතු කරමි. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ඇස්තමේන්තුගත උසාවි දඩ රු.8,913,628 ක් හා මුද්දර ගාස්තු රු.31,711,876 ක් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 29 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ බැවින් එම කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබූ නමුත් | වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කර අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා පනවාගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

අවශ්‍යතාවය අනුව කිසිදු අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින මිල්ල ලන්ද ජල ව්‍යාපෘතියේ ධාරිතාවය වැඩි කිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල සභා අරමුදල් හා පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් රු. 2,834,444 ක් වැයකර අමතර ජල සැපයුමක් ඉදිකිරීමට කටයුතු කර තිබුණද, 2019 ජනවාරි 28 වන විටද නිමකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉදිකිරීම් නියමිත කාලය තුළ ඉටුකර මහජන සේවය සැලසීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ අවසානයේ දී සිදු කිරීමට සිදු වූ ව්‍යාපෘතියක් බැවින් පොම්පාගාරය වෙත විදුලිය ලබා දීම සඳහා කොන්ත්‍රාත්වරු විසින් ලං.වි.ම. වෙත ගෙවීම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ නළ එලීමේ කටයුතු ද අවසන් කර ඇති අතර ඒ අනුව විදුලි සැපයුමද ලබාදී ඇති අතර අදාළ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකිරීමට 2019 වර්ෂයේ දී බලාපොරොත්තු වෙමි. |
| (ii) | රු. 9,400,000 ක් වැයකර කඩකාමර 7 කින් සමන්විතව ඉදිකර තිබුණු බෝවත්ත බස් නැවතුම්පල වසර 03 ක් ගත වී තිබුණද, අදාළ අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. | සභාව සතු දේපල තුළින් මහජන සේවය මෙන්ම සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වසරේදී අවශ්‍ය ප්‍රතිපාදන සපයාගෙන බස්නැවතුම්පල ක්‍රියාකාරී තත්ත්වයට ළඟාකර ජනතා අයිතියට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (iii) | 2017 හා 2018 වර්ෂවල පළාත් නිශ්චිත මාර්ග , ප්‍රවාහන සංවර්ධන හා වෙළඳ නිවාස ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යංශ ප්‍රතිපාදන මත කහවල වත්ත පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු. 7,189,225 ක් වැයකර වසර දෙකක් ගතවී තිබුණද, ජනතාවට ජලය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අරමුණු සඳහා යොදාගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී ප්‍රතිපාදන යොදවා ක්‍රියාකාරි තත්ත්වයකට පත්කිරීමට බලාපොරොත්තු වෙමි.මේ සඳහා ජනතා ඉල්ලීම් මත ජලය ලබා දීමේ නළ පද්ධතිය පුළුල් කළ අතර ඒ සඳහා අලුතින් නළ ලිඳක් පවා ඉදි කරන ලදි.හැකියාව ඇති ජල ප්‍රමාණයට අදාළ ජලය ලබා දීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඇ) කර්තව්‍යයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අයවැය ලේඛනය අනුව අයවැයගත රු. 3,368,590 ක් වූ කර්මාන්ත 20 ක් ඉටු කර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටු කිරීමට අවධානය යොමු කළ යුතු වේ. | 2018 වර්ෂයේ ආරම්භයේම මහජන නියෝජිතයින්ගේ පැමිණීමත් සමඟ ඔවුන්ගේ යෝජනා ප්‍රමුඛගත කිරීමට සිදු වූ බැවින් 2018 අයවැය තුළ අන්තර්ගත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටනොහැකි විය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වසර ගණනාවක සිට පැවත එන රු.1,695,256 ක ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකී ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් ලෙස රු.1,408,026 ක මුදලක් ගිණුමේ සටහන් වී ඇති අතර එම මුදල 2018 වර්ෂයේ අත්තිකාරම් ලේඛනයේ සටහන් වී නොමැත මෙය පෙර වර්ෂවල සිට එන ශේෂයක් බැවින් ඉදිරියේදී සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරමි. එකතුකළ අගය මත බදු මුදල වන රු. 242,889 හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල වන රු. 44,341 මුදල් හැකිතාක් ඉක්මනින් ගෙවීමට කටයුතු කරමි. |
| (ආ) | සක්‍රීය තත්ත්වයේ නොපවතින ප්‍රජා මණ්ඩල සඳහා බෙදා දීමට රු.661,550 ක පුටු 700 ක් මිලදී ගෙන තිබුණු අතර 2019 අප්‍රේල් 08 වන විටද එම පුටු බෙදාදී නොතිබුණි. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුවේ. | මේ වන විට ප්‍රජා මණ්ඩල සක්‍රීය තත්ත්වයට පත් කර ඇති අතර හැකි ඉක්මනින් මෙම පුටු ප්‍රජා මණ්ඩල සඳහා බෙදා දීමට කටයුතු කරමි. |
| (ඇ) | ක්‍රීඩා සමිති සඳහා බෙදා දීමට රු.199,580 ක ක්‍රීඩා උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2019 අප්‍රේල් 08 දින වන විටද ක්‍රීඩා උපකරණ බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුවේ. | මිලදී ගත් ක්‍රියාවලියේ දෝෂ ඇති අතර එය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. ඉදිරියේදී පවත්වනු ලබන ප්‍රධාන උත්සවයකදී මෙම භාණ්ඩ බෙදා දීම සිදු කිරීමට නියමිතය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ පුරප්පාඩු තනතුරු 34 ක් සහ අතිරික්ත තනතුරු 19 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවාගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| **(ආ) සේවක ණය** | | |
| අසනීප වීම නිසා සේවයට වාර්තා නොකරන නිලධාරියකුගේ රු.162,230 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.160,980 හා 1,250 යන ශේෂයන් දේපළ ණය හා උත්සව අත්තිකාරම් වන අතර ඔහු මේ වනවිට සේවයට වාර්තා නොකිරීම මත අය කර ගැනීමට නොහැකි වී ඇත. |
| **(ඇ) සේවක ඇප** | | |
| 2018 වර්ෂයේදී නිලධාරීන් 42 කගෙන් රු. 64,975 ක ඇප මුදලක් අයකර ගෙන තිබූ නමුත් ඒවා නිලධාරීන්ගේ නමින් තැන්පත් ගිණුම්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ නමින් ගිණුම් ආරම්භ කර එම ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ යුතු වේ. | සේවක ඇප සඳහා ගිණුම් ආරම්භ කර ඇත්තේ නිලධාරින් කිහිපදෙනෙකුට පමණි.ඉදිරියේදී එම ගිණුම් ආරම්භ කර ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (ආ) 2018 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන තිබූ කර්මාන්ත 51 ක් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබූ කර්මාන්ත 140 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී තිබුණි. | එක් එක් අංශ අතර මනා සම්බන්ධීකරණය තුළින් කාර්යයන් නිවැරදිව ඉටු කිරිමට කටයුතු කළ යුතු වේ. | පරිසර අංශය හා ආදායම් අංශය අතර සන්නිවේදනයේදී ඇතිවී ඇති මෙම ගැටළුව 2019 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) සභාව සතු සිසිල සෙවන (මටවන කන්ද) කට්ටි අංක 17 දරන රුඩ්. 01 පර්චස් 21.7 ක් වූ ඉඩම අනවසරයෙන් අයෙකු භුක්ති විදින අතර කට්ටි අංක 44 දරන රුඩ්. 01 පර්චස් 4.1 ක ඉඩම හඳුනා ගත නොහැකි අයුරින් පැවතුණි. | සභාව සතු දේපල ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉහත සභාවට අයත් ඉඩමෙහි අනවසරෙන් ඉදිකර ඇති ගොඩනැගිලි සහ පරිහරණය කිරීම් ඉවත් කරගන්නා ලෙස අදාළ පාර්ශවය වෙත දන්වන ලදි. වැටමායිම් සකස් කිරීමට කටයුතු කරන බවද දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව සතුව පවතින රු.856,136 ක් වටිනා වත්කම් 04 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ ඉවත්කිරීමට කටයුතු කළ යුතු වේ. | අංක 01 හා 02 යන වත්කම් සඳහා යාන්ත්‍රික ඉංජිනේරු වාර්තා ලබාගෙන අලුත්වැඩියා කිරීම සඳහා යොමුකර ඇත.කුට්ටිගල් මැෂින් දෙක සඳහා අවම තක්සේරු මුදල යාන්ත්‍රික ඉංජිනේරු මහතාගෙන් ලබාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ සහා අරමුදල් රු.3,100,000 ක් වැයකර ග්‍රීන් එස්ටේට් ඉඩමේ ඉදිකර තිබුණු ප්‍රජා ශාලාව හා වැසිකිළි පද්ධතිය 2018 දෙසැම්බර් 31 දින වන විටද භාවිතයට ගෙන නොතිබුණි. | සභා අරමුදල් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට අවධානය යොමු කළ යුතු වේ. | ජන ශූන්‍ය ප්‍රදේශයක ඉදිකර ඇති නිසා ජලය සපයා ගැනීමේ ගැටලුවක් ඇති වී තිබේ. ඉදිරියේදී මෙම ස්ථානය උත්සව ශාලාවක් ලෙස වැඩිදියුණුකර මෙම වැසිකිළි පද්ධතියවිවෘත කිරීමට කටයුතු කරමි.ඉහත ඉදිකිරීම අදියර වශයෙන් ක්‍රියාත්මක කර වඩා ඵලදායි කටයුතු සඳහා යොදාගැනීමට බලාපොරොත්තු වෙමි. |
| (ඇ) | 2015 වර්ෂයේ රු. 7,000,000 ක් වැයකර බෝවත්ත නගරයේ ඉදිකළ දෙමහල් වැසිකිළි පද්ධතිය ජනතාවට ප්‍රයෝජනයට ගත නොහැකි අයුරින් යතුරු ලා වසා තිබුණි. | මහජන මුදල් වැයකර ඉදිකරන වත්කම් ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා ජල සැපයුම ලබා දී ඇති අතර ඉදිරියේදී මෙහි ඇති අනෙකුත් අඩුපාඩු ද සකස් කර ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. අදාල ලියකියවිලි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**3.5.2** **වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අංක 252-6372 දරන කැබ් රථය සඳහා නව බඳක් තැබීමට රු. 1,475,000 ක ඇස්තමේන්තු ගත මුදලට ගිවිසුම්ගතව තිබුණු අතර තෝරාගත් ආයතනය විසින් සභාවේ අනුමැතිය ලබා දීමට පෙර යාන්ත්‍රික ඉංජිනේරුගේ උපදෙස් මත පමණක් පදනම්ව රු. 206,209 ක අමතර අළුත්වැඩියාවක් සිදුකර ගෙවීම් කරන ලෙස සභාවට දන්වා තිබුණි. මුල් ඇස්තමේන්තුවේ සඳහන් අයිතමයන් අමතර ඇස්තමේන්තුවේද ඇතුළත්ව තිබුණු අතර ඒ සඳහා රු. 46,300 ක් වැයකර තිබුණි. | වැඩියෙන් ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව යාන්ත්‍රික ඉංජිනේරු මහතා දැනුවත් කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන අතර එසේ එකම වියදමක් දෙවතාවක් දක්වා තිබේනම් හෝ ගෙවා ඇත්නම් එම මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.6** **අවිධිමත් ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් හා ගිණුම් අධ්‍යක්ෂ නමින් වූ රු. 200,000 ක්, මහා මාර්ග අමාත්‍යාංශය නමින් රු.3,095 ක් හා ණය ගැතියෝ රු.20,494,008 ක් හඳුනා ගැනීමකින් තොරව ජ'නල් අංක 27,28 හා 39 මගින් සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | ශේෂ කපාහැරීමේ දී කේවල ශේෂ හඳුනාගෙන ජ'නල් සටහන් යෙදීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය ගැති ශේෂයන්ට අදාළව කිසිදු තොරතුරක් හෝ උප ලේඛනයක් සොයා ගත නොහැක |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජල ව්‍යාපෘති ණය හිමි ශේෂය රු.310,132 ක් හා විවිධ ණය හිමියන් රු.12,354,100 ක් විධිමත් අනුමැතියකින් තොරව ජ'නල් අංක 29 හා 35 මගින් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | ශේෂ කපාහැරීමේ දී කේවල ශේෂ හඳුනාගෙන ජ'නල් සටහන් යෙදීමට කටයුතු කළ යුතු වේ. | මෙම ණය හිමි ශේෂයන්ට අදාළව කිසිදු තොරතුරක් හෝ උප ලේඛනයක් සොයා ගත නොහැක. |

**3.7 ප්‍රසම්පාදනය**

--------------

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා සකස් කර ඇති බව දන්වා සිටිමි. |

**3.7.2 සැපයීම් හා සේවා**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වීථි පහන් හා උපකරණ මිලදී ගැනීමේදී ඇතැම් අයිතමයන් සඳහා පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමකින් තොරව අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන ප්‍රතික්ෂේප කර වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 201,475 ක අලාභයක් සිදු වී තිබුණි. | සභා අරමුදලට වාසිදායක වන ලෙස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන කමිටුව ගනු ලැබූ සාමූහික තීරණයක් බැවින් ඒ සම්බන්ධව ඉදිරියේදී ගරු මන්ත්‍රී තුමන්ලා දැනුවත් කර නිවැරදි තීරණ ගැනීම උදෙසා කටයුතු කරමි. |

**3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 22 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/01 හි 02 ඡේදය ප්‍රකාරව මාර්ගවලට බොරළු ඇතිරීම වැනි තාවකාලික ක්‍රියාමාර්ග සිදු නොකළ යුතු | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු අතර අදාළ කර්මාන්තය ගිවිසුම් ප්‍රකාරව සිදුකරන බවට අධීක්ෂණය කළ | 2019 වර්ෂයේ අදාල මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගරු සභාව දැනුවත් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ලෙස දක්වා තිබුණද 2018 වර්ෂය තුළ මාර්ග 35 ක බොරළු ඇතිරීම සඳහා රු. 2,378,257 ක් වැයකර තිබුණි. එම බොරළු ඇතිරූ මාර්ගවල නිසි සණකමට බොරළු නොයෙදීම, බොරළු සෝදා යාම හා වලවල් සහිත වීම දක්නට ලැබුණි. | යුතු වේ. | |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රු.996,275 ක් වැයකර මූකලන්හේන ග්‍රාම නිලධාරී වසමේ ඩිල්ෂාන් වෙළඳසැල පානවැව දක්වා දිවෙන නාමල් උයන මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම ලෙස දක්වා තිබුණද, මාර්ගයේ කොටසක් රු. 114,649 ක වියදමින් කොන්ක්‍රීට් කර තිබූ අතර භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට මතුපිට ගල් ගැලවෙමින් පැවතුණි. | අදාල ඉදිකිරීම් නිවැරදිව සිදු කිරීමට කටයුතු කළ යුතු අතර සභාව විසින් අධීක්ෂණය කළ යුතුවේ. | ඉහත අඩුපාඩුව කොන්ත්‍රාත් සමිතිය වෙත දන්වා ඇති අතර කොන්ක්‍රීට් තට්ටුව මතුපිට තාර ආලේපයක් යොදා චිප්ස් ඉස සකස් කිරිමට කොන්ත්‍රාත්කරුට දන්වා ඇති අතර එය නිවැරදි කර රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |